# 2557 - මූලික පිරිවෙන් වර්ෂ අවසාන පරීක්ෂණය - 2013

**4 ශ්‍රේණිය** **(10) භූගෝල විද්‍යාව** **පැ තුනයි**

* 1 , 2 ප්‍රශ්නවලට ද දෙවන කොටසින් ප්‍රශ්න 3 කට ද පිළිතුරු සපයන්න.

**(01)** සුදුසු පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) සෞරග්‍රහ මණ්ඩලයේ පෘථිවිය දෙපස ඇති ග්‍රහ ලෝක දෙක වන්නේ,

i. බුද හා සිකුරුය
ii. සිකුරු හා අඟහරුය
iii. බුද හා අඟහරුය
iv. අඟහරු හා බ්‍රහස්පතිය

(ii) ලංකාව පිහිටා ඇත්තේ,

i. උතුරු අක්ෂාංශ $5^0$ - $10^0$ අතර ය.
ii. දකුණු අක්ෂාංශ $5^0$ - $10^0$ අතර ය.
iii. උතුරු අක්ෂාංශ $5^0$ - දකුණු අක්ෂාංශ $10^0$ අතර ය.
iv. නැගෙනහිර දේශාංශ $5^0$ - $10^0$ අතර ය.

(iii) ලංකාවේ බටහිර වෙරළබඩ පිහිටි නගර 4 කි.

i. කොළඹ , මිගමුව , මාතර , ගාල්ල
ii. කොළඹ , කලුතර , මීගමුව , හලාවත
iii. කලුතර , හලාවත , දෙවුන්දර , බෙන්තර
iv. හලාවත , බේරුවල , ගම්පහ , රාගම.

(iv) ලංකාවේ දිස්ත්‍රික්ක සංඛ්‍යාව

i. 22 කි.
ii. 25 කි.
iii. 24 කි.
iv. 26 කි.

(v) (සාක්) දකුණු ආසියා සහයෝගිතා සංවිධානයට අයත් නොවන රටක් වනුයේ,

i. මාල දිවයින යි.
ii. භූටානය යි.
iii. ඇෆ්ගනිස්ථානය යි.
iv. බංග්ලාදේශය යි.

(vi) ලංකාවට වැඩි ම වර්ෂාවක් ලැබෙන්නේ,

i. නිරිත දිග මෝසමෙනි.
ii. ඊසාන දිග මෝසමෙනි.
iii. චාසුළිවලිනි.
iv. සංවහනයෙනි.

(vii) ඕස්ට්‍රේලියාව පිහිටා ඇත්තේ ලංකාවට,

i. දකුණු දිශාවෙනි
ii. නැගෙනහිර දිශාවෙනි
iii. වයඹ දිශාවෙනි
iv. ඊශාන දිශාවෙනි

(viii) ලංකාවේ විශාල ම ස්වභාවික වරාය වන්නේ,

i. කොළඹ
ii. මඩකලපුව
iii. ගාල්ල
iv. ත්‍රිකුණාමලය

The National e-Learning Portal for The General Education


(ix) ලංකාවට ආසන්න ප්‍රබල දකුණු ඉන්දියා ප්‍රාන්තය වන්නේ,

i. තමිල්නාඩුව
ii. බෙංගාලය
iii. මහා රාෂ්ට්‍රය
iv. උත්තර ප්‍රදේශය

(x) ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ,

i. සමකයට උතුරිනි.
ii. සමකයට දකුණිනි.
iii. සමකයට නැගෙනහිරිනි.
iv. සමකයට බටහිරිනි. (2x10 =20)

**(02)**




1. A අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?
2. B ස්ථානයේ පිහිටි තුඩුව කුමක් ද?
3. C ස්ථානයේ පිහිටි කලපුව කුමක් ද?
4. D අක්ෂරයෙන් දැක්වෙන වරාය කුමක් ද?
5. E අක්ෂරයෙන් දැක්වෙන අභය භූමිය කුමක් ද?
6. F අක්ෂරයෙන් දැක්වෙන කඳු පංතිය කුමක් ද?
7. G අක්ෂරයෙන් දැක්වෙන ත්‍රිකෝණාකාර ප්‍රදේශය වැදගත් වන්නේ කුමන වගාවට ද?
8. H අක්ෂරයෙන් දැක්වෙන තීරයේ පිහිටි ඛනිජ සම්පත කුමක්ද?
9. I අක්ෂරයෙන් දැක්වෙන ඔය කුමක් ද?
10. J අක්ෂරයෙන් දැක්වෙන රේඛාව කුමක් ද?

(2 x 10 = 20)

## II කොටස

(03) (i) ලංකාවේ ප්‍රධාන ස්වභාවික වෘක්ෂලතා කලාප මොනවා ද?

(ii) කඳුකර කලාපීය වනාන්තරවලට ආවේණික ලක්ෂණ 3 ක් ලියන්න.

(iii) ලංකාවේ වන ගහනය ශීඝ්‍රයෙන් හීන වෙමින් පැවතීමට හේතු මොනවා ද?

(iv) වනාන්තර අඩු වීමෙන් ඉදිරියේ දී අපට මුහුණ දීමට සිදුවන ඛේදජනක තත්ත්වයන් පිළිබඳ විමසීමක් කරන්න. (5x4 = 20)

(04) (i) අප රටට සංචාරකයන් එන ප්‍රධාන රටවල් මොනවා ද?

(ii) සංචාරකයින් ආකර්ශනය වන අප රටේ ඇති යෝග්‍යතා මොනවා ද?

(iii) සංචාරක කර්මාන්තයෙන් අප ලබන ප්‍රතිලාභ මොනවා ද?

(iv) ඉදිරි සංවර්ධනය සඳහා සංචාරක කර්මාන්තය තවත් සකස් විය යුතු ආකාරය පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න. (5x4 = 20)

(05) (i) ලංකාවේ වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක 03 ක් ලියන්න.

(ii) එම දිස්ත්‍රික්කවල වී වගාවේ ව්‍යාප්තිය සඳහා හේතු වී ඇති සාධක මොනවා ද?

(iii) වී වගාවේ සංවර්ධනයට මෑත කාලයේ දී රජයන් මගින් ගෙන ඇති ප්‍රධාන ක්‍රියා මාර්ග මොනවා ද?

(iv) වී ගොවියා මුහුණ දෙන ගැටලු පිළිබඳ විමසීමක් කරන්න. (5x4 = 20)

(06) (i) කාර්මික සංවර්ධනය සඳහා යොදාගත හැකි ලංකාවේ ඛණිජ සම්පත් 3 ක් පිහිටි ප්‍රදේශ ලියන්න.

(ii) කර්මාන්තයක් යම් ප්‍රදේශයක ස්ථානගත වීම සඳහා බලපාන සාධක මොනවා ද?

(iii) මෑත කාලයේ දේශීය කර්මාන්ත සංවර්ධනය පිණිස ගෙන ඇති ප්‍රධාන ක්‍රියාමාර්ග 5 ක් නම් කරන්න.

(iv) තවමත් අප අත්‍යාවශ්‍ය ම කාර්මික ද්‍රව්‍ය ආනයනය කරන රටක් වීමට හේතු දක්වන්න.

(5x4 = 20)

(07) (i) ලංකාවේ ජනාධික ම දිස්ත්‍රික්ක 3 නම් කරන්න.

(ii) බස්නාහිර පළාතේ ලංකාවේ වැඩිම ජනගහනයක් විසීමට හේතු දක්වන්න

(iii) අධි ජනගහනයෙන් කොළඹ ආශ්‍රිතව පවතින පරිසර ගැටලු මොනවා ද?

(iv) ලංකාවේ ජනගහනයේ විෂම ව්‍යාප්තිය දුරලීම පිණිස ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න. (5x4 = 20)